**විසර්ජන ශීර්ෂය 112 - විදේශ කටයුතු අමාත්‍යාංශය**

**විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

---

**1.1 විගණන විෂය පථය**

විදේශ කටයුතු අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 දෙසැම්බර් 23 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම්**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන නිරීක්ෂණ**

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව විදේශ කටයුතු අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.13 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛණ වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842දරණභාණ්ඩාගාර චක්‍රලේඛය. | යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි. |

**(ආ) විසර්ජන ගිණුම**

(i) **මුළු ප්‍රතිපාදනය හා වියදම**

සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.8,534,620,050 ක් වු අතර, වර්ෂය අවසාන වන විට ඉන් රු.8,300,821,166 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.233,798,884 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 03 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 5,700,400,000 | 7,330,094,950 | 24,694,828 | 0.34 |
| මූලධන | 939,700,000 | 1,204,525,100 | 209,104,056 | 17.36 |
| එකතුව | 6,640,100,000 | 8,534,620,050 | 233,798,884 | 2.74 |

(ii) **අයවැය විචලනය.**

මූලධන වැය විෂයයක් සඳහා රුපියල් මිලියන 17ක පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම යටතේ ප්‍රතිපාදන ලබාගෙන අපේක්ෂිත පරිදි උපයෝජනය නොකිරීම නිසා

එම ප්‍රතිපාදනයෙන් රුපියල් මිලියන 06ක් ඉතිරිවී තිබුණි. තවත් මූලධන වැය විෂයයන් දෙකක් වෙනුවෙන් සළසා තිබුණු ප්‍රතිපාදනවලින් රුපිල් මිලියන 28 ක් රුපියල් මිලියන 139 ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.

**(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

විෂය අංක 11201 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.** | **රු.** | **රු.** | **රු.** | **රු.** | **රු.** |
| 21,000,000 | 17,878,927 | 18,000,000 | 24,715,933 | 110,000,000 | 94,760,576 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 11201 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.3,075,677 ක් වූ අතර, 2014 පෙබරවාරි 12 දින වන විට ඉන් රු.1,621,277 ක් අයකර ගෙන තිබුණි.

(ii) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ සම්පූර්ණ එකතුවත් දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂයත් අතර රු.99,202 ක වෙනස මුදල් රෙගුලාසි 427 හි විධිවිධාන ප්‍රකාරව සසඳා නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 05 කදී ආපදා ණය වශයෙන් එකතුව රු.436,551 ක ගෙවා තිබුණි. එසේ ණය ලබා ගත් නිලධාරීන්ගෙන් ණය වාරික අයකර ගැනීමේදී ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3:5 වගන්තියට පටහැනිව අදාල නිලධාරීන්ගේ වැටුපෙන් සියයට 40ක ප්‍රමාණය ඉක්මවන පරිදි අදාල ණය ගෙවීම සිදුකර තිබුණි.

(iv) 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛයෙහි 4 ඡේදය පරිදි හා 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ආපදා ණය ගෙවීමේදි උපරිම ණය හිමිකම රු.250,000 ක් විය යුතු වුවත්, උක්ත චක්‍රලේඛ වලට පටහැනිව 2012 වර්ෂයේ අවස්ථා 08 කදී රු.1,175,120 ක ආපදා ණය වැඩියෙන් ගෙවා තිබුණි.

**(ඈ) අග්‍රිම ගිණුම්**

---------------

අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුමේ රු.1,587,129,924 ක් වූ හර ශේෂ හා රු.457,464,517 ක් වූ බැර ශේෂ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 අප්‍රේල් 30 දින වන විට අමාත්‍යාංශය පියවා නොතිබුණු අග්‍රිම ශේෂ එකතුව රු.663,474,619 ක් වී තිබුණි.

(ii) අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 වන දිනට අග්‍රිම ගිණුම්වල ශේෂයන්, එදිනට නිරවුල් නොවූ අත්තිකාරම් ශේෂ හා විදේශ දූත මණ්ඩලවල මුදල් ශේෂයන්ද ඇතුළත්ව රු.103,322,295 ක ශේෂ සසඳා නොතිබුණි.

(iii) අමාත්‍යාංශය හා දූත මණ්ඩලවල එකතුව රු.472,238,076 ක අත්තිකාරම් වසර 1-34 දක්වා කාල පරාසයක් නොපියවා පැවතුණි. මෙම ශේෂය තුළ දැනට පදිංචිව සිටින නිවාස සඳහා තැන්පත් කරන ලද අත්තිකාරම් ශේෂද ඇතුළත් වන අතර අයනොවන ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල මට්ටමක පැවතුණි.

(iv) ආයතන සංග්‍රහයේ XIV වන පරිච්ඡේදයේ 27:8 වගන්තියට පටහැනිව එකම නිලධාරියාට අවස්ථා කිහිපයකදී ලබා දුන් නොපියවූ අත්තිකාරම් ශේෂය රු.9,527,236 ක් වූ අතර දීර්ඝ කාලීනව නොපියවා ඇති අත්තිකාරම් ශේෂ සම්බන්ධව එම පරිච්ඡේදයේ 27:7 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(v) මුදල් රෙගුලාසි 212(2)(V) ප්‍රකාරව වැටුප් අත්තිකාරම් ලෙස 2007 වසරේ සිට ලබාදුන් එකතුව රු.323,179ක මුදලක් පඩි ලයිස්තුවෙන් අඩුකර ගෙන නොතිබුණි.

(vi) තානාපති කාර්යාල මගින් 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා රු.17,101,592 ක් බැංකු ඇපකර ලබා දී තිබූ අතර, ඒ තුළ වසර 03ට වඩා පැරණි රු.7,689,687 ක ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඉ) පොදු තැන්පත් ගිණුම්**

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.926,572,601 ක් වූ අතර, ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 6000/0000/00/0006/0071/000 | 35,857,444 |
| 6000/0000/00/0011/0559/000 | 16,845,552 |
| 6000/0000/00/0015/0025/000 | 873,869,605 |
| **එකතුව** | **926,572,601** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 2ක් ඉක්ම වූ රු.25,537,532 ක් වූ තැන්පතු 46 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අදාලව අංක 6000/0000/00/0006/0071/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2012 දෙසැම්බර් 31 දිනට රු.35,857,443ක ශේෂයක් වූ අතර එම ගිණුම 2011 වර්ෂයෙන් පසුව අක්‍රිය වී තිබුණි.

(iii) ජෝර්දානයට රැකියා සඳහා පිටත්වී විවිධ හේතූන් මත ආපසු ලංකාවට ගෙන්වා ගැනිම සඳහා ලංකාවේ සිටින ඔවුන්ගේ ඥාතීන් විසින් විදේශ කටයුතු අමාත්‍යාංශයේ තැන්පත් කරන ලද මුදලින් ගුවන් ටිකට්පත් සඳහා වැයකිරීමෙන් අනතුරුව රු.537,277 ක් ඉතිරිවී තිබුණි. එම ඉතිරි වූ මුදල් අදාල හිමිකරුවන් වෙත 2012 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

## 1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය.

### 1.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සහා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03ක් සඳහා සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වුවත් , එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.4.2 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

ඉහත 1.4.1 හි ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 අප්‍රේල් 27 දින පිළියෙල කර නොතිබුණි.

## 1.5 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.**

නියැදි විගණන පරික්ෂණවලදි නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම. |
|---|---|---|
| ---------------------- | -------------- | ------------------- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය ------------------ | රු. | |
| මුදල් රෙගුලාසි 102 | 916,650 | නැතිවීම් හා පාඩු යටතට ඇතුළත් නොවන නොපියවූ අත්තිකාරම් ලෙස දක්වා තිබූ අවස්ථා 07 කදී අයකර නොගත් නිවාස ආරක්ෂිත ඇප තැන්පතුද අලාභ හානි ලෙස විසර්ජන ගිණුමේ දක්වා තිබුණි. |
| මුදල් රෙගුලාසි 106 | 16,190,207 | ඌණතාවයන්, අයතා පරිහරණයන් හෝ වෙනත් කරුණක් නිසා මුදල් නැති වූ විටක ඊට වගකීම් පැවරි ඇති නිලධාරියාගෙන් ආපසු අයකර ගත නොහැකි අවස්ථාවලදී භාණ්ඩාගාරයෙන් අත්තිකාරමක් ලබාගෙන එම පාඩු පූර්ණය කළ යුතු වුවත් 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා අයතා පරිහරණය ලෙස අවස්ථා 05 දී වාර්තා වී තිබුණු මෙම මුදල විසර්ජන ගිණුමේ අලාභ හානි ලෙස දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පැවතුණි. |

**1.6 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ දුර්වලතා**

**----------------------------------------**

2000 සැප්තැම්බර් 27 දිනැති අංක 00/1848/23/19 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් අමාත්‍යාංශයට නිවාස 20ක් මිළදි ගැනිම සඳහා ව්‍යාපෘතියක් අනුමත කර ඇත. දීර්ඝ කාල ප්‍රමාදයකින් පසු එනම් 2006 නොවැම්බර් 01 දින වන විට නිවාස 20 න් 16ක් භාර ගෙන තිබුණු අතර ඒ සඳහා ගිවිසගත් මුදලට වඩා රු. 5,065,000 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි. ඉතිරි නිවාස 04 ඉදි කිරිම සඳහා මුලික සැලසුම්, ඇස්තමේන්තු සහ ගිවිසුම් අත්සන් කිරිමකින් තොරව සියළු ගාස්තු ඇතුළත්ව රු.30,550,820 කට පොරොන්දු වී තිබුණි. මෙම නිවාස 20 මිළදි ගැනිමට 2000 සිට 2012 වර්ෂය දක්වා දීර්ඝ කාල ප්‍රමාදයක් ගතවීම නිසා වෙන්කළ මුදලට වඩා රු. දස ලක්ෂ පහළවක් වැඩියෙන් ගෙවීමට සිදුව තිබුණි. නිවාසවල අයිතිය තහවුරු කිරිමට පිළිගත් සාක්ෂි නොවූ අතර ගිවිසුමකට එළඹීමකින් තොරව මෙම නිවාස පරිහරණය කිරිමට ඉඩ සළසා තිබුණි.

**1.7** **බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**(අ) ගැළපුම් කළ යුතු ශේෂ**

2012 දෙසැම්බර් 31 දිනට වූ මාස 06 ඉක්මවූ චෙක්පත්වලින් කැනඩා ඩොලර් 1,640 ක් ඩුබායි ඩිරාම් 1,400 ක් හා බ්‍රසීල් රීල් 6,069 චෙක්පත් 2013 දෙසැම්බර් 03 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

**(ආ) කැන්බරා දූත මණ්ඩලය**

(i) විසර්ජන ගිණුමේ සටහන් (IV) සී බැංකු ගිණුම් සැසඳුම් පිළිබඳ තත්ත්ව වාර්තාව අනුව නවසීලන්ත ඩොලර් ගිණුමේ බැංකු ප්‍රකාශනය අනුව ශේෂය ලෙස නවසීලන්ත ඩොලර් 866 ක් දක්වා තිබුණද බැංකු සැසඳුමෙහි බැංකු ප්‍රකාශය අනුව ශේෂය නවසීලන්ත ඩොලර් 1,466 ක් විය. තවද එම ගිණුමේ බැංකු සැසඳුමෙහි මුදල් පොත අනුව ශේෂය නවසීලන්ත ඩොලර් 884 ක් වුවද විසර්ජන ගිණුමේ එම ශේෂය නවසීලන්ත ඩොලර් 457 ක් ලෙස දක්වා තිබුණි. මෙම ශේෂ සසඳා නොතිබුණි.

(ii) විසර්ජන ගිණුමේ සටහන් (IV) සී බැංකු ගිණුම් සැසඳුම් පිළිබඳ තත්ත්ව වාර්තාව අනුව ඕස්ට්‍රේලියානු ඩොලර් ගිණුමේ බැංකු ප්‍රකාශයට අනුව ශේෂය ලෙස ඕස්ට්‍රේලියානු ඩොලර් 78,972 ක් ලෙස දක්වා තිබුණද, බැංකු සැසඳුමෙහි එම ශේෂය ඕස්ට්‍රේලියානු ඩොලර් 26,994 ක් වී තිබුණි. තවද, එම ගිණුමේ මුදල් පොත අනුව ශේෂය ඕස්ට්‍රේලියානු ඩොලර් 19,063 ක් වුවද, විසර්ජන ගිණුමේ එය ඕස්ට්‍රේලියානු ඩොලර් 49,994 ක් ලෙස පෙන්වා තිබුණි.

**(ඇ)** දූත මණ්ඩලවල 2012 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ වල අඩුපාඩු.

(i) දූත මණ්ඩල වල මුදල් පොතේ ශේෂය හා බැංකු සැසඳුමේ ශේෂය අතර නොගැලපීම් විද්‍යාමාන වූ අතර එය බර්ලින්වල යුරෝ 30,046, බැංකොක්වල ගිණුම් අංක 070981 අදාලව ඇමරිකන් ඩොලර් 304,016, ලන්ඩන් ගිණුම් අංක 1701 හි 2014 පෙබරවාරි 26 දිනට පවුම් 4,309, හැනෝයි වල ඇමරිකානු ඩොලර් 339, චෙන්නායි වල 2014 පෙබරවාරි 26 දිනට ගිණුම් දෙකකට අදාලව ඉන්දියානු රුපියල් 10,109, වියානා වල 2014 පෙබරවාරි 26 දිනට බැංකු ඇපකර ලෙස එකතු කළ යුරෝ රු.26,825ක් ද බ්‍රසීලයේ බැංකු ගිණුම් දෙකකට අදාල බ්‍රසීල් ඩොලර් රියාල් 2,026 ක හා ඇමරිකානු ඩොලර් 313 ක ශේෂයන් විය.

(ii) බර්ලින් දූත මණ්ඩලයේ හඳුනානොගත් හර යුරෝ 18,785 ද, වොෂින්ටන් වල 2014 පෙබරවාරි 26 දින වන විට ඩොලර් 1,047 නිෂ්කාශනය වී නොතිබූ අතර එදිනට පැරිස් දූත මණ්ඩලයේ නිෂ්කාශනය නොවූ මුදල පවුම් 15,453 ක් විය.

(iii) බර්ලින් දූත මණ්ඩලයේ යුරෝ 21,292 ක් ද, ලන්ඩන් ගිණුම් අංක 1701 යටතේ පවුම් 4,328 ද, පැරිස් දූත මණ්ඩලයේ පවුම් 49,374 හා , හැනෝයි දූත මණ්ඩලයේ වියට්නාම් ඩොන්ග් 3,274 ක්ද සෘජු බැර කිරීම් විය. තවද පැරිස් දූත මණ්ඩලයේ පවුම් 15,453 හා හැනෝයි දූත මණ්ඩලයේ වියට්නාම් ඩොන්ග් 7,209 ක්ද සෘජු හර කිරීම් විය.

(iv) ලන්ඩන් දූත මණ්ඩලයේ ගිණුම් අංක 1701 සඳහා වන බැංකු ගිණුමේ මුදල් පොතට අනුව ශේෂය පවුම් 750 ක් වුවද, බැංකු සැසඳුම පිළියෙල කිරීමේදි එය පවුම් 4,463 ක අයිරාවක් ලෙස ගෙන බැංකු සැසඳුම පිළියෙල කර තිබූ අතර අංක 6800 සඳහා වන බැංකු ගිණුමේ මුදල් පොතට අනුව ශේෂය පවුම් 4,520 ක් වුවද, බැංකු සැසඳුම පිළියෙල කිරීමේදි එය පවුම් 1,233 ක් වී තිබුණි.

## 1.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-------------------------------------

අමාත්‍යාංශය විසින් කර ඇති සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරික්ෂණ වලදි එසේ අනාවරණය වූ ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

**(අ)** ඉතාලියේ රෝම තානාපති කාර්යාල සේවයට නිලධාරීන් බඳවා ගැනීමේදි ඉතාලියේ පවතින සේවක නීතිය හා නීති කටයුතු පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමු නොකිරීම සහ නිසි කලට තීන්දු වලට එරෙහිව අභියාචනා නොකිරීමත් නිසා ඉතාලි තානාපති කාර්යාලයට බඳවා ගත් නිලධාරීන් 5 දෙනෙකුගේ සේවය අවසන් කිරීම වෙනුවෙන් යුරෝ 91,422 (ශ්‍රී.ල.රු.15,541,740) ක වන්දි ඉල්ලා උසාවියේ නඩු පවරා තිබුණි.

**(ආ)** තානාපති කාර්යාලයේ සේවය කර ඉවත්ව ගිය නිලධාරීන් කිහිප දෙනෙකු විසින් ඉතාලි තානාපති කාර්යාලයට විරුද්ධව කම්කරු උසාවියට ඉදිරිපත් කර තිබූ පැමිණිල්ලක් හේතු කොට ගෙන ඉතාලි බලධාරීන් විසින් තානාපති කාර්යාලයීය නිල බැංකු ගිණුම නවතා දමා තිබුණි. තානාපති කාර්යාලයේ නිලධාරීන් ඉතාලියේ බල පැවැත්වෙන ශ්‍රම නීති පිළිබඳව නිසි අවධානය යොමු නොකිරීම සහ තානාපති කාර්යාලය විසින් ඒ සම්බන්ධව නිදහසට කරුණු කම්කරු උසාවියේදී ඉදිරිපත් නොකිරීම නිසා නිල

බැංකු ගිණුම වසා දැමීමට මූලික හේතුව වූ අතර, මේ නිසා ශ්‍රී ලංකාවේ කීර්තිනාමයටද අහිතකර ලෙස බලපා තිබුණි.

**1.9 අවිධිමත් ගනුදෙනු**

---------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාපටිපාටියෙන් බැහැර වීම.**

-----------------------------------------------------------------------

2012 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්මේ පහත දැක්වෙන දුර්වලතාවයන් අනාවරණය විය.

(අ) අමාත්‍යාංශය ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමකින් තොරව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණු අතර ප්‍රසම්පාදන සැලැස්මද මාස 06ට නොඅඩු කාලයක් තුළ යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) තානාපති කාර්යාලවල ප්‍රසම්පාදනයන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

**1.10 පාඩු හා හානි**

---------------

විදේශ තානාපති කාර්යාලවලට අදාළ වසර 5-10 අතර කාලයක පවතින සිද්ධි 19කට අදාළ රු.23,003,084 ක පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 හා 109 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**1.11 කළමනාකරණ දුර්වලතා**

---------------------------

විදේශ දූත මණ්ඩල විසින් තානාපති/ මහ කොමසාරිස් නිල නිවාස හා නිලධාරි නිල නිවාස සඳහා කුලී පදනම මත ගොඩනැගිලි ලබා ගැනීම හා ඒ හා සම්බන්ධ විශාල කුලී මුදලක් ගෙවා තිබුණි. ජපන් තානාපති කාර්යාලයේ 2007 සිට 2012 වර්ෂය දක්වා ජපන් යෙන් 56,883,300 ක් කුලී වශයෙන් ගෙවා තිබුණි. අදාල ගිවිසුම් සමහර අවස්ථාවලදී නිසි පරිදි අළුත් කර නොතිබුණි.

දීර්ඝ කාලීන සැලැස්මක් මත කුලී ගෙවීම අවම කර ගැනීම සඳහා ගොඩනැගිලි ලබා ගැනීම කෙරෙහි අමාත්‍යාංශය අවධානය යොමු කර නොතිබුණි.

**1.12 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තත්‍ය සේවක සංඛ්‍යා (විදේශ දූත මණ්ඩල හැර)**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 92 | 75 | 17 | - |
| තෘතියික මට්ටම | 07 | 06 | 01 | - |
| ද්විතීයික මට්ටම | 330 | 244 | 86 | - |
| ප්‍රාථමික මට්ටම | 134 | 137 | - | 03 |
| වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 22 | - | 22 |
| **එකතුව** | **563** | **484** | **104** | **25** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට විදේශ දූත මණ්ඩල 14ක අනුමත නොකළ තනතුරු 14 ක් සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගෙන තිබුණු අතර, දූත මණ්ඩල 16 ක අතිරික්ත සේවක සංඛ්‍යාව 32 ක් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 104 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) බඳවාගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.